# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/55 - 2019 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා - 2019.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉ.අමා.යොමු අංකය: 4-3/2/2016/CEB/113.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: හඟු/3/2/1/116.

පුනර්ජනනීය බලශක්ති ලබාගැනීම සඳහා වූ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යෝජිත රාගල ග්‍රිඩ් උපපොල තැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

01. **සර්වේ ජනරාල්ගේ පිඹුරු අංක පි.පි.නු. 3221හි කැබලි අංකය 01**

ඉඩමේ නම: රහතුන්ගොඩ වත්ත; විස්තරය: අවුරුදු 25ක් පමණ වයසැති තේ වගාවක් ඇත; හිමිකම් කියන අය: ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 2; ඉඩම් ප්‍රමාණය: හෙක්. 1.6187.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පවරන ලද අයවලුන් හෝ 2019.03.27 වැනි දින පූ.භා. 10.00ට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019.03.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අමිල නවරත්න,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2019 පෙබරවාරි මස 20 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 475


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29524 - 27 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.